සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HQ/6/EP/06/2019/ක්‍රි.සැ.
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2019.06.27

***සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 09/2019***

සියළුම දිස්ත්‍රික්ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2019</u>**

අඩු ආදායම් ලාභින්ගේ ජීවන තත්ත්වය තිරසාර ලෙස වර්ධනය කිරිම තුලින් දිවයිනේ ආර්ථික සංවර්ධනය ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරිම උදෙසා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන "සමෘද්ධි ධනාභිමානී" වැඩසටහනට සමගාමීව 2019 ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත. ඒ අනුව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

2019 වර්ෂයේ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන මගින් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන 25 ක් ඉදි කිරිම
2. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය.
3. අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය
4. දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

5. සුළු පරිමාණ සමෘද්ධි ව්‍යාපාරිකයින් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
6. විශේෂ අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

**1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීම**

ආදර්ශ වැඩසටහනක් ලෙස ගාල්ල බද්දේගම ආරම්භ කරන ලද සමෘද්ධි සුව බොජුන්හල සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර ඉදිරියේදී දිවයින පුරා එවැනි "සමෘද්ධි සුව බොජුන්හල්" හා අලෙවි මධ්‍යස්ථාන 350 ක් ආරම්භ කිරිමට අපේක්ෂිතය. මෙහි පලමු අදියර ලෙස දිස්ත්‍රික්කයකට එක් මධ්‍යස්ථානයක් වන සේ මධ්‍යස්ථාන 25 ක් මෙම වසර අවසාන වනවිට ඉදි කිරිමට අදහස් කර ඇත. මේ වනවිටත් බොජුන්හල් ආරම්භ කරගෙන පවත්වාගෙන යන සහ දැනටමත් ඉදිකිරිම් කටයුතු කරගෙන යන දිස්ත්‍රික්ක තුලද නව මධ්‍යස්ථානයක් ආරම්භ කළ යුතුය. මෙම වැඩසටහනට අදාල උපදෙස්, අංක DSD/HO/6/EP/2/SS/10 හා 2019.05.31 දිනැති ලිපිය මගින් දැනටමත් ඔබ වෙත යොමු කර ඇත.

**2. "සමෘද්ධි සුව බොජුන්හල්" හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය.**

සමෘද්ධි වැඩසටහන තුලින් ගොඩනැගුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සහ වස විස රහිත ක්ෂනික ආහාර සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරිමේ අරමුණ ඇතිව පෙර වර්ෂ වලදී ඉදිකිරිම් ආරම්භ කරන ලද එහෙත් මෙතෙක් වැඩ අවසන් නොවූ ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම වෙනුවෙනි. මෙම මධ්‍යස්ථාන තුල ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් පසු සමෘද්ධි ව්‍යවසායකයින්ගෙන් අය කරනු ලබන කුලී ආදායමින් ආයතනයේ වැඩිදියුණුව හා නඩත්තුව සිදු කිරිමට අවශ්‍ය උපදෙස් ඉදිරියේදී ලබා දෙනු ඇත.

එබැවින් පෙර වර්ෂ තුළ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘති වල තවදුරටත් කළයුතු අත්‍යාවශ්‍ය වැඩ කොටස් වෙනුවෙන් පමණක් සකස් කරන ලද වියදම් ඇස්තමේන්තු නොපමාව <u>ව්‍යවසාය සංවර්ධන අංශය</u> වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු වන අතර, ඒ සඳහා මෙතෙක් ලද ප්‍රතිපාදන වලින් කරන ලද වැඩ කොටස් හා වියදම් පිළිබඳව වාර්තාවක් සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ව්‍යාපෘති කඩිනමින් වැඩ අවසන් කොට මෙම වසරේදී විවෘත කිරිමට අවශ්‍ය පියවර ගැනීම අදාල දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

**3. අලෙවි යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම**

3.1 **ප්‍රාදේශිය සමෘද්ධි ව්‍යාපාරික සංගම් ශක්තිමත් කිරීම**

දැනටමත් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක බැගින් වන සේ ස්ථාපිත කර ඇති සමෘද්ධි ව්‍යාපාරික සංගම් ශක්තිමත් කිරිම මෙහි අරමුණයි. ඒ අනුව එහි **පලමු අදියර** ලෙස දිස්ත්‍රික්කය තුල වඩාත්ම හොඳින් ක්‍රියාකාරිව කටයුතු කරන ව්‍යාපාරික සංගම් සඳහා ප්‍රාග්ධන භාණ්ඩ ලබාදිය යුතුය.

එම භාණ්ඩ ලබාගැනීමේදී ව්‍යාපාරික සංගම් සමග සාකච්ඡා කර ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව තිරණයකට එලඹීම වඩාත් ඵලදායී වන අතර තනි තනි ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා නොවිය යුතුය. ප්‍රමුඛතාවය සකස් කිරිමේදී මේ සමග ඇමුණුම් 01 හි දක්වා ඇති නිර්ණායක ද සැලකිල්ලට ගැනීම වැදගත් වනු ඇත.

මෙහිදී එක් ප්‍රාදේශිය ව්‍යාපාරික සංගමයක් සඳහා උපරිම රු:70,000.00 ක් වැය කළ හැකි අතර ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා තෝරාගත යුතු ව්‍යාපාරික සංගම් සංඛ්‍යාව ඇමුණුම් 02 මගින් දක්වා ඇත. අවම අවශ්‍යතා හෝ සපුරා නොමැති සහ ක්‍රියාකාරිත්වයක් නොමැති ව්‍යාපාරික සංගම් මෙම වැඩසටහන සඳහා තෝරා නොගත යුතය.

**3.2 සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම**

සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කුඩා පරිමාණයේ ගෘහස්ථ ගබඩා ඉදිකිරීම, ජංගම අලෙවි රථ, ජංගම අලෙවි කුටි මෙන්ම නිෂ්පාදනවල තත්ත්වය, ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සහ අගය එකතු කිරීමේ නිෂ්පාදන සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර හා උපකරණ සැපයිම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබාදීමට මේ යටතේ හැකියාව ඇත.

එක් ව්‍යවසායකයකු සඳහා ඉහත ව්‍යාපාරික අවශ්‍යතාවලින් එක් අවශ්‍යතාවක් වෙනුවෙන් නැවත අය නොකිරීමේ පදනම මත ප්‍රතිපාදන ලබාදිය හැකි අතර දෙපාර්තමේන්තු දායකත්වය සමස්ථ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුවෙන් 50% කි. කෙසේ වෙතත් එම මුදල රු. 25,000.00 ක උපරිමය නොඉක්මවිය යුතු අතර එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.50,000.00 ක් වනසේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

**4. දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම**

සමෘද්ධි වැඩසටහන තුලින් ගොඩනැගුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපළ පුළුල් කරදිමේ අරමුණ ඇතිව දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන මෙම වසරේදීත් පැවැත්වීමට සැලසුම් කර ඇත. එය මෙවර **"සෞභාග්‍යා - 2019"** යන තේමා පාඨය මුල් කරගනිමින් පැවැත්විය යුතුය. සිංහල හා හින්දු අළුත් අවුරුද්ද, නත්තල් උත්සවය වැනි ජාතික උත්සව හෝ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් වශයෙන් වෙළඳපලක් ඇතිවන, වසරේ ඕනෑම අවස්ථාවක් ඉලක්ක

කරගනිමින් ප්‍රදර්ශන සංවිධානය කළ හැකි අතර වෙළඳ ප්‍රදර්ශන සංවිධානය සඳහා මූලික උපදෙස් DSD/HO/6/EP/2/9-2019 හා 2019.03.14 දිනැති ලිපිය මගින් දැනටමත් ඔබ වෙත දැනුම් දී ඇත.

**5. අලෙවි මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් ක්ෂණික ආහාර සැකසීම සඳහා කාන්තා ව්‍යවසායකයින් පුහුණු කිරීම**

මෙම පුහුණු වැඩසටහන කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ පුහුණු අංශය මගින් දින දෙකක වැඩසටහන් ලෙස සිදුකිරීමට නියමිතය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානයකදී හෝ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානයක් තුල මෙම ප්‍රායෝගික හා න්‍යායික පුහුණුව ලබාදෙන අතර, ඔබ දිස්ත්‍රික්කය තුල ස්ථාපිත කිරීමට නියමිත "සමෘද්ධි සුව බොජුන්හල" පිහිටි ප්‍රදේශය ආසන්නයේ පදිංචි සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ අඩු ආදායම්ලාභී කාන්තාවන් තෝරාගත යුතුය. ඒ සඳහා හඳුනාගත් අයගේ නාමලේඛනය ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා සම්බන්ධිකරණ කටයුතු ව්‍යවසාය සංවර්ධන අංශය මගින් සිදු කරනු ඇත.

**6. විශේෂ වැඩසටහන්**

ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් නොවූ එහෙත් අත්‍යවශ්‍යව ඉටු කළයුතු හෝ කාලීන අවශ්‍යතාවයක් මත කළයුතු වැඩසටහන් හෝ යම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම මේ යටතේ සිදු කරනු ලැබේ. මේ සඳහා ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදුවනු ඇත.

<u>පොදු උපදෙස්</u>

01. ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජාවට ගැලපෙන ආකාරයට මෙන්ම ව්‍යවසායකයාගේ ව්‍යාපාරයේ තිරසාර බව තහවුරු වන ආකාරයට ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු අතර ඔහු /ඇය ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයෙකු බවට තහවුරුවක් ලබාගත යුතුය.

02. ව්‍යාපෘති සඳහා වන සියළු මිලදී ගැනීම් හා අනෙකුත් සියළු කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට අනුකූලව සිදුකළ යුතු බව අවධාරණය කෙරෙන අතර අදාල ආයතන හා දෙපාර්තමේන්තු නිර්දේශිත මිල ගණන් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමටද වගබලා ගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් පසුව මුදල් නිදහස් කිරීමට පියවර ගැනීම වඩාත් සුදුසු වේ.

03. ඉදිකිරීම් වලට අදාලව ආරම්භ කරනු ලබන ව්‍යාපෘති සියල්ල මෙම මුදල් වර්ෂය තුළ ඉදිකිරීම් අවසන් කළ යුතු අතර කිසිදු විටෙක ව්‍යාපෘති අවිච්ඡේද නොකළ යුතුය.

04. ව්‍යාපෘති අධීක්ෂණය, පසු විපරම් ක්‍රියාවලිය මෙන්ම ප්‍රගති සමාලෝචනයද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුවිය යුතු අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතුය.

05. භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන යටතේ කේවල ව්‍යාපෘති සඳහා අනුමත කරන මුදල් නැවත අය කිරීමක් නොකෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා සත්‍ය වශයෙන්ම දරන වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා 1.5%ක් ද වනසේ පරිපාලන වියදම් වෙන් කරනු ලැබේ.

06. ප්‍රාදේශීය මට්ටමෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ඇමුණුම් අංක 01 ආකෘතියට අනුව සකස් කොට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

07. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ව්‍යාපෘති ලේඛනය සඳහා අවශ්‍ය වන අග්‍රිම ඇමුණුම 02 මගින් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට අග්‍රිම ලබා ගත යුතුය.

08. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 03 මගින් එළඹෙන මස 10 වන දිනට පෙර අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

09. ව්‍යවසාය සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ යම් ප්‍රතිලාභියෙකු සඳහා රු. 25,000/-ක දෙපාර්තමේන්තු දායකත්වය ප්‍රමාණවත් නොවන්නේ නම් 50% දෙපාර්තමේන්තු දායකත්වය රු. 50,000/- ක් දක්වා වැඩි කළ හැකි අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතියක් ලබාගත යුතුය.

10. ව්‍යාපෘතිවලට අදාල ප්‍රදර්ශන නාම පුවරු සමෘද්ධි ලාංඡනය සහිතව අනුමත වර්ණයන් යොදා සකස් කළ යුතුය.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
02. අතිරේක ලේකම්(සංවර්ධන), සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -අ.ක.ස
04. ප්‍රධාන ගණකාධිකාරී -අ.ක.ස
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක -අ.ක.ස
06. සියළුම අංශ ප්‍රධානීන් -අ.ක.ස